**ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය - 2014**

**----------------------------------------------------------**

**ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සහ එහි පරිපාලිතයේ 2014 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1976 අංක 23 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන පනත සහ 1991 අංක 28 දරන සංශෝධිත පනතේ 24 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාලිත සමාගමේ ගිණුම් විගණනය කරන ලද්දේ එහි සාමාජිකයන් විසින් පත්කරන ලද වරලත් ගණකාධිකරණ සමාගමකිනි.මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

**මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.**

**මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.**

**මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**2.** මූල්‍ය ප්‍රකාශන

-------------------

**2.1** මතය - සමූහය

---------------

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

මතය - ආයතනය

-------------------

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

**2.2.1** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත -16

-------------------------------------

සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් දැනට භාවිතයේ පවතින පිරිවැය රු.28,442,953 ක් වූ වත්කම් අයිතමයන් 70 ක සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

**2.3** ලැබිය යුතු ගිණුම්

------------------

2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2කට වඩා වැඩි කාලයක සිට පවතින ණයගැති ශේෂය රු.696,186 ක් හා 2012 ජූනි 22 දින වසා දමන ලද යාපනයෙහි පිහිටි ගොඩනැගිල්ල සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදලින් රු.30,124 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි.

**2.4** නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2010 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත 114 වගන්තිය | 2013 හා 2014 වර්ෂවල දී ගෙවන ලද දිරි දීමනා සඳහා ගෙවිය යුතු උපයන විට බදු ගෙවීම් එම දිරි දීමනා ගෙවූ මාසයේ දී එකවර අඩු කිරීම සඳහා අනුප්‍රමාණ බදු වක්‍ර 2 අදාල කර ගනිමින් ගණනය කළ යුතු වුවත්, එම දිරි දීමනා මාස 12න් බෙදා වෙන වෙනම එක් එක් මාසයේ වැටුපට එකතු කර |

ගනිමින් සාමාන්‍ය බදු චක්‍ර 01 යටතේ උපයන විට බදුගෙවීම් ගණනය කර තිබුණි.

| | |
|---|---|
| (ආ) 2011 පෙබරවාරි 11 දිනැති අංක 57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. 06 ඡේදය | වාර්ෂික අයවැය ඇස්තමේන්තු සීමාව ඉක්මවා සිදුකරනු ලබන අලෙවි ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගෙන් අවසරය ලබාගතයුතු වුවත් ඊට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂයේ දී ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් රු.37,500,000 ක ඇස්තමේන්තුව ඉක්මවා රු.9,802,706 ක් වැයකර තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල- සමූහය

-------------------------

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ මෙහෙයුම් කටයුතුවලින් රු. 410,101,233 ක ශුද්ධ ලාභයක් (බදු පෙර) වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 500,954,657 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සඳහා මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.90,853,424 ක පිරිහීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේදී සමූහයේ ආදායම රු.218,651,066 ක වර්ධනයක් සිදුවී තිබුණද වැටුප් හා දීමනා රු.45,767,148 කින්ද උපදේශන හා පුහුණු වියදම් රු.192,313,498කින්ද, ක්ෂයවීම් ඇතුළුව ආයතන හා වෙනත් වියදම් රු.71,217,440 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

මූල්‍ය ප්‍රතිඵල - ආයතනය

----------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් රු. 240,026,097 ක ශුද්ධ ලාභයක් (බදු පෙර) වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 284,752,742 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.44,726,645 ක පිරිහීමක් දක්නට ලැබුණි.සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා රු.22,456,978 කින්ද, උපදේශන හා පුහුණු වියදම් රු.12,684,563 කින්ද, ආයතන හා වෙනත් වියදම් රු 7,723,305 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

4.1 කාර්ය සාධනය

-------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සමාලෝචිත වර්ෂයේ පාඨමාලා ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.18,374,088 කින් එනම් සියයට 2 කින් වැඩිවන විට සෘජු වියදම් රු.35,141,541 කින් එනම් සියයට 18 කින් වැඩිවී තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ දළ ලාභය පෙර වර්ෂයට සාපේක්ෂව රු.16,767,453 කින් එනම් සියයට 3.6 කින් අඩුවී තිබුණි.

(ආ) ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ කොළඹ ප්‍රධාන කාර්යාලය හා මහනුවර, කුරුණෑගල ,ගාල්ල හා මාතර යන ශාඛාවන්හි සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක කාලපරිච්ඡේදය තුලදී පවත්වන ලද පාඨමාලා හා සහභාගිවූ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කොළඹ ප්‍රධාන කාර්යාලයෙහි 2010 වර්ෂයේ පාඨමාලා 142 ක් ක්‍රියාත්මකව පැවති අතර එය 2012 වර්ෂය වන විට 150 දක්වා වැඩිකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ පාඨමාලා ප්‍රමාණය 143 දක්වා අඩු වී තිබුණි . මෙම පාඨමාලා සඳහා සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව 2011 වර්ෂයේ දී 8,139 දක්වා වර්ධනය වී තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී එය 6,011 දක්වා අඩු වී තිබුණි.

(ii) මහනුවර ශාඛාවේ 2010 වර්ෂයේදී සිසුන් 781 ක සහභාගිත්වයෙන් පාඨමාලා 23 පවත්වා තිබූ අතර එය ක්‍රමිකව වර්ධනය කර ගනිමින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පාඨමාලා සංඛ්‍යාව 44 ක් හා ශිෂ්‍ය සංඛ්‍යාව 1,428 දක්වා වැඩිකර ගැනීමේ හැකියාව තිබුණි. කෙසේ වුවද කුරුණෑගල ශාඛාවේ 2010 වර්ෂයේ පාඨමාලා 48 කට සිසුන් 1618 ක්ද සමාලෝචිත වර්ෂයේදී පාඨමාලා සංඛ්‍යාව 41 කට සිසුන් 1166 ක් සහභාගිවීමෙන් සහභාගි වූ ශිෂ්‍ය සංඛ්‍යාව ද ඒ අනුව අඩුවී තිබුණි.

(iii) ගාල්ල ශාඛාවේ 2010 වර්ෂයේ පවත්වා තිබූ පාඨමාලා සංඛ්‍යාව 31 වූ අතර එය 2013 වර්ෂය වනවිට පාඨමාලා සංඛ්‍යාව 38 දක්වා වර්ධනය කර ගැනීමත් ඒ අනුව ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකර ගැනීමටත් හැකි වී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේදී මාතර නව ශාඛාව විවෘත කිරීම හේතුවෙන් එහි පාඨමාලා 08 ආරම්භ කර තිබූ අතර ගාල්ලේ පාඨමාලා සංඛ්‍යාව 33 ක් විය. ගාල්ල සහ මාතර සමස්ථයක් ලෙස සැලකීමේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාවේ සියයට 12 ක පිරිහීමක් පැවතුණි.

(ii) සමස්ථයක් ලෙස සලකා බලන විට 2011 වර්ෂයේදී පාඨමාලා 236 ක් සඳහා ශිෂ්‍යයින් 11,423 ක් සහභාගිවී තිබුණද 2014 වර්ෂයේදී සංඛ්‍යාව 269 දක්වා වැඩිවී තිබූ නමුත් එයට සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව 9,775 දක්වා අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද වැඩමුළු හා කෙටිකාලීන පාඨමාලා සංඛ්‍යාව අඩුවීම මීට හේතු වී ඇති බව සභාපතිවරයා විසින් දන්වා ඇත.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල ඇතුළත් වී, පාඨමාලා හැරගිය ශිෂ්‍යයින් සංඛ්‍යාව 400 ක් වී තිබුණි. ශිෂ්‍යයින් පාඨමාලාව හැර යාමට හේතු වූ කරුණු පිළිබඳ පරීක්ෂා කර ඊට පිළියම් යොදා නව පාඨමාලාවක් හඳුන්වාදී බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය කර ගැනීමක් හා සැලසුම් සහගතව පාඨමාලා ක්‍රියාත්මක කිරීමට ආයතනයේ අවධානය යොමුවී නොතිබුණි.

**4.2** කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 ඔක්තෝබර් 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම, ප්‍රදානයක් වශයෙන් ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයට පවරා දීමට අනුමැතිය

ලබාදී තිබුණද, 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩමේ නීත්‍යානුකූල හිමිකම ආයතනයට පවරාගෙන නොතිබුණි.

(ආ) 2007 නොවැම්බර් 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ආයතනයට පවරා දීමට තීරණය කළ ගාල්ල නගරයෙහි පිහිටි ඉඩමක 2010 මාර්තු 31 දිනට රු.302,707,070 ක් වැය කර අධ්‍යාපන මධ්‍යස්ථානයක් ඉදිකර ඇතත් එම ඉඩමේ නීත්‍යානුකූල හිමිකම 2015 දෙසැම්බර් 31 දින දක්වාම ආයතනයට පවරාගෙන නොතිබුණි.

4.3 නිෂ්ක්‍රීය වත්කම්

-------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 9,140,508 ක් වූ ලිපිද්‍රව්‍ය තොගය තුල රු.327,324 ක් වූ ලිපිද්‍රව්‍ය ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

4.4 ආර්ථික නොවූ ගණුදෙනු

---------------------------

2012 පෙබරවාරි 03 දින නිකුත් කළ පත්වීම් ලිපියකට අනුව සම්බන්ධීකාරක නිලධාරී තනතුරකට 2012 පෙබරවාරි 08 දින සිට බලපාන පරිදි මාස 06 ක කාලයකට මාසිකව රු.30,000 ක මුදලක් ගෙවීමේ පදනම මත නිලධාරියෙකු පත්කර තිබුණි. 2014 දෙසැම්බර් 12 දින දක්වා ඔහුගේ සේවා කාලය දීර්ඝ කර ගනිමින් වර්ෂ 2 මාස 11 ක පමණ වූ කාලයක් සේවය කර තිබුණද එම කාලපරිච්ඡේදය තුල ඔහුගේ පැමිණීම හා පිටවීම පිළිබඳ සටහන් තබා නොතිබුණු අතර ඉටුකළ කාර්යයන් පිළිබඳ තොරතුරු ලබා නොගෙන ආයතනය විසින් එම නිලධාරියාට අදාල කාල පරිච්ඡේදය තුල රු.1,050,000 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ 2015 දෙසැම්බර් 10 දින දීය.

5.2 සංයුක්ත සැලැස්ම

--------------------

2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම අනුව,ශුද්ධ ලාභයේ වර්ධනය ඉකුත් වර්ෂයට සාපේක්ෂව වාර්ෂිකව සියයට 20 කින් වැඩිවීම අපේක්ෂා කළද සමාලෝචිත වර්ෂයේ ලාභයේ පිරිහීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට15.7 ක් විය.

5.3 අයවැය ලේඛනමය පාලනය

-----------------------------------

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම හා වියදම, සත්‍ය ආදායම හා වියදම සමඟ සැසඳීමේදී මෙහෙයුම් ආදායම රු.මිලියන 25.67 කින් හෙවත් සියයට 3 කින් අඩුවීමක් නිරීක්ෂණය වූ අතර සංවර්ධන වියදම් සියයට 176 කින්ද, පරිත්‍යාග සියයට 140 කින්ද, ප්‍රසාද දීමනා සියයට 83 කින්ද වශයෙන් වාර්ෂික ඇස්තමේන්තුගත වියදම ඉක්මවා වියදම් කර තිබීමෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

**-------------------------**

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.**

**(අ) පාඨමාලා පැවැත්වීම**

**(ආ) වත්කම් කළමනාකරණය**